**රඹුක්කන ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රඹුක්කන ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(i)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(i)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයට අදාළව ලැබිය යුතු ව්‍යාපාර බදු හිඟ ආදායම් රු. 504,551 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මේ වන විට නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇතත්, රටේ පැවති තත්ත්වය මත ආදායම අහිමිවීම නිසා බදු මුදල් සම්බන්ධව සාධාරණයක් කරන ලෙස කරන ලද ඉල්ලීම සලකා ආණ්ඩුකාරවරයාගේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරන බවත්,එතෙක් හිඟ ආදායම් ලෙස ඉදිරියට ගෙන නොමැති බවත්, දන්වා තිබුණි. | ලැබිය යුතු සියලුම ආදායම් ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු.9,475,818 ක් ගිණුම්ගත නොකිරීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය හා ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආයෝජන පොළී උපචිත පදනම මත ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාලව ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී ලද වරිපනම් බදු රු. 2,310,263 ක් සඳහා දුන් වට්ටම වූ රු.244,963ක් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේදී 2020 වර්ෂය සඳහා ලැබුණු මුදල වරිපනම් බදු පරිගණක මෘදුකාංගය අනුව වැඩියෙන් පෙන්නුම්කරන බවත් ඒ පිළිබඳ තවදුරටත් සොයා බලා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | වර්ෂයට අදාල වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ලද වරිපනම් බදු වටිනාකම රු. 1,878,567 ක් වුවද කලින් ලද වරිපනම් ගිණුමට රු. 2,078,275 ක් මාරු කිරීම නිසා එම ගිණුම සහ වරිපනම් ණයගැති ගිණුම රු. 199,708 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි. |
| (ඉ) | ප්‍රාදේශීය සභාවට එරෙහිව නඩු 20 ක් ද, සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 03 ක් ද වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නඩු ගාස්තු ලෙස රු. 471,422 ක් ගෙවා තිබුණ ද නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | නඩු පිළිබඳ ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළ යුතුයි. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 24,225,693 ක් හා උප ලේඛන අනුව වටිනාකම රු. 29,549,993 ක් වූයෙන් රු. 5,324,300 ක වෙනසක් විය. | මෙම වෙනස දීර්ඝ කාලයක සිට පවතින බැවින් තවදුරටත් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාලව රු. 6,319,581 ක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අනුව උපලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බවත් , තවදුරටත් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | ගිණුම් ශේෂයන්ගේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට ශේෂයන් සැදුම්ලත් ආකාරය දක්වන උපලේඛන ඉදිරිපත් කළ යුතුයි. |

## 1.7 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| අංක 185 රීතිය | සභාපතිවරයාගේ අනුමැතිය මත 2016 හා 2020 වර්ෂය අතර කාලය තුල රාජ්‍ය බැංකු 3ක සිදුකරන ලද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.182,844,816 ක් වූ ආයෝජන 10ක් සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී සභා අනුමැතිය ලබා ගෙන ආයෝජන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.42,748,428 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,858,197 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක කාලයක් ඉක්මවා ඇති අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය රු. 76,909 ක් විය. | පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ආදායම් රැස්කිරීම් ප්‍රගතිය අඩු මට්ටමක පැවතුන බවත්, මේවන විට සැලසුම් සකස් කර ප්‍රගතිය ඉහල මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

(ආ) කුලී

-----

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කාමර කුලී ශේෂය රු. 1,933,875 ක් වූ අතර කඩකාමර වල අඩුපාඩු පැවතීම හේතුවෙන් වර්ෂ 02 ඉක්මවූ ශේෂ අය නොවී පවතින අතර, වර්ෂ 05 ට වැඩි හිඟ ශේෂය අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි. | කඩ කාමරවල අඩුපාඩු නිසා බදු මුදල් නොගෙවීමත් , කඩිනමින් අඩුපාඩු සකස් කර මෙම හිඟය සම්බන්ධව ඉදිරි කටයුතු කරන බවත් පින්නවල අලි අනාථගාරය අසල රථගාල, හා කෙසෙල්කැන් වෙළඳපල හිඟ මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බවත් රු.530,581 ක් වන අවු 05 ට වැඩි හිඟ ශේෂය අයකර ගැනීම සම්බන්ධව නඩු පවරා ඇති බවත් දන්වා තිබුණි. | අඩුපාඩු සකසා දී ගිවිසුම් ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 4,252,229 ක් හා මුද්දර ගාස්තු රු. 16,430,179 ක් විය. | උසාවි දඩ/ මුද්දර ගාස්තු සම්බන්ධව අදාළ ආයතන නිරන්තර දැනුවත් කිරීම සිදු වුවද සමාලෝචිත වර්ෂයට ආදාළ මුදල් සභාව වෙත ලැබෙන්නේ එම වර්ෂයේ නොවන බව දන්වා තිබුණි. | අදාල ආයතන දැනුවත් කර සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

පාරිසරික ගැටලු

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ඒකතු කරන ලද කසල ප්‍රමාණය ටොන් 2208ක් පමණවන අතර කසළ කළමණාකරනය සඳහා දරා ඇති වියදම රු. 18,693,421ක් පමණ වේ. එහෙත් සභාව විසින් කසල වෙන්කර ලබා ගැනීමට කටයුතු නොකරන බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනය කර ඉතිරිවන නොදිරන ද්‍රව්‍ය සහ පොලිතින් විනාශ කිරීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | දෛනිකව එකතුවන පොලිතීන් සඳහා දාහකයක් ඉදිකිරීමට ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘති වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර ඇති නමුත් අනුමත කර නොමැති අතර සනීපාරක්ෂක කසල රදවනයක් සඳහා ඉඩමක් මිලදී ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇතත් මේවන විටද විසඳුමක් ලැබී නොමැති බැවින් ඉදිරියේදී ඒ සඳහා Insee ආයතනය හා සම්බන්ධ වී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දන්වා තිබුණි. | සභාව කසල කලමනාකරණය සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළ යුතුයි. |